## ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය - 2012

---

ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතින් සංශෝධිත 2000 අංක 45 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (සංශෝධන) පනත 10 ඉ (I) වගන්තිය | පනත ක්‍රියාත්මක කිරීමේ දිනයේ සිට බල පැවැත්වෙන පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය (බීඅයිඩීටීඅයි) කදිරගාමර් ආයතනය වෙත පවරනු ලැබිය යුතු අතර,පුහුණු වැඩ සටහන් සහ වෙනත් අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සඳහා වගකිවයුතු ඒකකයක් වශයෙන් එම ආයතනය ක්‍රියාත්මක විය යුතුවිය. නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මෙම ආයතන දෙක වෙනමම ක්‍රියාත්මක වන ආයතන දෙකක් වශයෙන් පවත්වාගෙන ගොස් තිබුණි. |
| (ආ) 1980 අංක 46 දරණ සේවක භාරකාර අරමුදල් පනත | ආයතනය විසින් 2011 සැප්තැම්බර් සිට 2012 මැයි මාසය දක්වා සේවක භාරකාර අරමුදල් පනත ප්‍රකාරව නියමිත දිනට මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් රු.11,934 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| 9.3.1 වගන්තිය | ආයතනය මඟින් අනුමත තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සකස් කර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,367,328 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.563,642 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි

රු.3,930,970 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම රු. මිලියන 8.9කින් වැඩිවූවද ආදායම රු. මිලියන 12.9 කින් වැඩිවීම මෙම වර්ධනයට හේතු වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය

---------------------------

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6:5:1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන අවුරුදු 2 මාස 10 ක් ප්‍රමාදව 2016 ජනවාරි 8 දින ඉදිරිපත් කර තිබුණි.

### 4.2 සංයුක්ත සැලැස්ම

---------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් ඉදිරිපත්කර නොතිබුණි.

### 4.3 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබු බැවින් පනතේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ ප්‍රමාණාත්මකභාවය පිළිබද විගණනයේදී සෑහිමකට පත්විය නොහැකි විය.

### 4.4 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

### 4.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

--------------------------------

2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

--------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා වෙත වරින්වර පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) සේවක මණ්ඩල කළමනාකරණය

(ආ) අයවැය පාලනය